# 2022 නොවැම්බර් මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2022 නොවැම්බර් මස මාසික සභා රැස්වීම 2022.11.10 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොටුව මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුම
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.එච්.ඒ.කරුණාරත්න මිය
2. කළමනාකරණ සේවා නිලධාරී - පී.කේ.ඩී.සී.කුමාරි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපතිතුමා විසින් මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

### 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම

2022.10.13 වන දින මාසික සභා රැස්වීම් වාර්තාවේ සංශෝධනයන් ලෙස, වෙනත් කරුණු යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද ගොඩකවෙල ඩිපෝවේ සිට ගමන් කළ බස් රථ බොහෝමයක් දැනට නතර කර ඇති බවත් ඉල්ලීමක් කළද එයටද පිළිතුරක් නොවුන බැවින් දැනට පරිපාලනය අසාර්ථක වී ඇති බවත් එය සාමාන්‍ය නිලධාරීන් විසින් එනම්

කොන්දොස්තර/රියදුරන් විසින් පරිපාලන කටයුතු කරගෙන යෑමක් සිදුවන හෙයින් එය විධිමත් ක්‍රමවේදයකට ක්‍රියාත්මක නොවන බැවින් ඒ පිළිබඳව ප්‍රධාන මූලස්ථානයේ සිට අදාළ සියළුම ආයතන වලට දන්වන ලෙසද ඉල්ලා සිටි අතර එය පසුගිය වාර්තාවේ සඳහන් නොවීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලද සංශෝධනය සහ පසුගිය සභා වාරයේදී වෙනත් කරුණු යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය විසින් පෙර සභා වාරයකදී වැලිගෙපොල ලේකම් කොට්ඨාසයේ සහල් සහනාධාර බෙදාදුන් පිරිසගේ නාමලේඛණයක් වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ගෙන්වාදෙන ලෙස ඉල්ලා සිටියද එය නොලැබුණු බවට කළ ප්‍රකාශය සහා වාර්තාවේ සඳහන් නොවීම පිළිබඳ ගරු මන්ත්‍රීතුමිය විසින් සඳහන් කරන ලද සංශෝධනයන්ට යටත්ව පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 2. <u>ගරු සභාපතිතුමාගේ නිවේදන</u>

### 2.1. ජල බිල්පතේ නම සංශෝධනය කිරීම

- එස්.එච්.ජයතිලක නමින් ඇති අංක UD – 1/8 දරණ ජල බිල්පත පී.එම්.ඩී.ප්‍රසාදනී නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

- ජී.අයි.ජානක පත්මලාල් නමින් ඇති අංක UD- 275 දරණ ජල බිල්පත ටී.එස්. නන්දනී කුසුමලතා නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## 3. <u>සභාව නමින් ලැබී ඇති ලිපි,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම</u>

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්, නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

## 4. <u>යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න</u>

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය**.**

## 5. <u>කල් දී ඇති යෝජනා</u>

### 5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සභාව සම්මත කිරීම.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන සහ පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ, මූල්‍ය හා පරිපාලන රීති වලට අනුගත වෙමින් මෙම සභාව විසින් 2023 වර්ෂය සඳහා පිළියෙළ කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනයට සභා අනුමැතිය ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

2023 වර්ෂය සඳහා මෙම සභාව විසින් පිළියෙල කරන ලද අයවැය කෙටුම්පත ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරමින් 2023 වර්ෂයේදී සමස්ථ අයවැය තුලින් මුළු පුනරාවර්තන ආදායම රුපියල් 115,191,690.00 ක් ලෙසද, පුනරාවර්තන වියදම රුපියල් 106,629,748.00 ක් ලෙසත් අපේක්ෂා කරන අතර රුපියල් 8,561,942.00 ක් වූ අතිරික්තයට සබරගමුව පළාත් සභාවේත් මධ්‍යම රජය හා වෙනත් මූලාශ්‍රයන් හරහා ලබා ගැනීමට අපේක්ෂා කරන ප්‍රතිපාදනද යොදවා ප්‍රාග්ධන ඇස්තමේන්තු පිළියෙල කර ඇති බවත් සඳහන් කළේය.එමෙන්ම පසුගිය වර්ෂයේ ආදායම් වියදම් හා මෙම වර්ෂයේ සමීක්ෂණ වාර්තා සැලකිල්ලට ගනිමින් මෙම අයවැය පිළියෙල කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කළේය.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් අද දින ඉදිරිපත් කරන ලද අයවැය කෙටුම්පතෙහි යම් සංශෝධනයක් ඇත්නම් ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා ගන්නා ලෙසට මෙදින සභාවෙන් ඉල්ලා සිටියේය.

එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරනු ලැබීය. අනතුරුව ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීම පහත සඳහන් පරිදි සිදු විය.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොටුව මැතිතුමා**</u>

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොටුව මැතිතුමා, මෙම අයවැය කෙටුම්පත තුලින් වෙන්කර ඇති මාතෘ හා ළමා සෞඛ්‍ය අරමුදල් සහ පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා වන අරමුදල් ප්‍රමාණවත් නොවන බවත්, 2021 සහ 2022 වර්ෂවල මාතෘ හා ළමා සෞඛ්‍ය සඳහා කිසිදු වැය කිරීමක් සිදු නොකිරීම කණගාටුවට කරුණක් බවත්, අනතුරුදායක ගස් ඉවත් කිරීම හරහා නිසි ලෙස සැලසුම් කිරීම තුලින් මෙම ඇස්තමේන්තු ආදායමට වැඩි ආදායමක් උපයා ගත හැකි බවත් ප්‍රකාශ කළ අතර 104(1) වැය ශීර්ෂයට අනුව වාහන, යන්ත්‍රසූත්‍ර, උපකරණ අළුත්වැඩියා හා නඩත්තු වියදම් වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය ඉතා වැඩි බවද පෙන්වා දුන්නේය.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.උපුල් වසන්ත කුමාර මැතිතුමා**</u>

2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.උපුල් වසන්ත කුමාර මැතිතුමා, මෙම අයවැය තම ධූරකාලය තුළ ඉදිරිපත් වන පස් වෙනි අයවැය වන අතර මෙහි අපේක්ෂිත ආදායම් යටතේ වන වරෙන්තු හා දඩ ගාස්තු, සමාජ ශුභ සිද්ධිය යටතේ සලකා බලන විට අඩු අගයක් විය යුතු බැවින් ප්‍රායෝගිකව එය ලබන වසරේ අපේක්ෂිත ආදායම ලෙස ගන්නා විට එය අඩුවිය යුතු බව පැහැදිලි කළේය. තවද සෑම වීදියකම දක්නට ලැබෙන අයාලයේ ඇවිද යන ගවයන් සඳහා නිසි වැඩපිළිවෙලක් සැකසිය යුතු බවත්, ජේ.සී.බී. යන්ත්‍රය කුළියට දීම නිසි ලෙස සැලසුම් කිරීමෙන් මෙම ආදායම් මාර්ගය වැඩි කර ගත හැකි බවද නිලධාරීන් පුහුණු කිරිම සඳහා වෙන්කර ඇති මුදල වැඩි විය යුතු බවද එමඟින් රටක ආයෝජනයේ කාර්යක්ෂමතාවය වැඩි කර ගැනිමට හැකිවන බැවින් ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු බව ප්‍රකාශ කළේය.

තවදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා, මෙම අයවැය කෙටුම්පතෙහි සඳහන් මූල්‍ය අගයන්වල මිනුම් ඒකකය(රුපියල්ද මිලියන ද ආදී වශයෙන්) සඳහන් කර නොමැති බවද පෙන්වා දුන් අතර වාහන, යන්ත්‍රසූත්‍ර, උපකරණ අළුත්වැඩියා හා නඩත්තු වියදම් වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය වැඩි බවත් මන්ත්‍රී දුරකථන දීමනා සඳහා වෙන්කර ඇති මුදලද ප්‍රමාණවත්ද යන්න විමසුවේය. එයට අදහස් දැක්වූ ගරු සභාපතිතුමා එම මුදල ප්‍රමාණවත් නොවන බැවින් එය සංශෝධනය වියයුතු බව ප්‍රකාශ කළේය.

තවද, ගරු මන්ත්‍රීතුමා විසින් සංග්‍රහ වියදම් අඩුවිය යුතු බවත් පෙර පාසැල් උපකරණ ලබා ගැනීම සඳහා වෙන්කර ඇති මුදල ප්‍රමාණවත් නොවන බැවින් අනවශ්‍ය වියදම් කපා හැර ඒ සඳහා අරමුදල් ප්‍රමාණය වැඩිකරන ලෙසත් සෑම මන්ත්‍රීවරයෙකු වෙනුවෙන්ම වෙන්කරනු ලබන රු.100,000.00 ක ප්‍රතිපාදන වෙන් කර නොමැති බවත් පැවසූ අතර, පෙන්වා දුන් එම කරුණු පදනම් කරගෙන මෙම අයවැය කෙටුම්පතට විරෝධය දක්වන බව සඳහන් කළේය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා</u>**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින්, මහජන නියෝජිතයන්ගේ අදහස් හා යෝජනා සම්බන්ධයෙන් වෙන් කරන ප්‍රතිපාදනය (මාර්ග නඩත්තු වියදම් ) වෙන් කර නොමැති බව පෙන්වා දුන් අතර පෙර වර්ෂයේ ප්‍රතිපාදනය ලබාදෙන ලෙසද ඉල්ලා සිටිමින් 2023 වර්ෂයේ අයවැය කෙටුම්පතට සිය එකඟතාවය ප්‍රකාශ කර සිටින ලදි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය</u>**

2023 අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය, මෙවර අයවැය තුලින් ද පසුගිය අයවැයට වඩා වෙනසක් සිදු වී නොමැති බවත්, ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේම ප්‍රගතිය පමණක් නොව මෙම කොට්ඨාස දෙක අතරින් වැලිගෙපොල කොට්ඨාසය තුළද ප්‍රගතියක් අවශ්‍ය බවත් නමුදු මේ දක්වා වැලිගෙපොල කොට්ඨාසය තුළ විශේෂ ප්‍රගතියක් දක්නට නොමැති බවත් පැවසුවාය.

තවද මෙම සභා වාර වලදී ඉදිරිපත් වුන හදිසි යෝජනා පමණක් ක්‍රියාත්මක වූ අතර මහජන නියෝජිතයින්ගේ ඉල්ලීම් ක්‍රියාත්මක නොවුන බවද වැඩිදුරටත් ප්‍රකාශ කළාය. ඒ අනුව මෙම අයවැය කෙටුම්පතට විරුද්ධ බව ප්‍රකාශ කළාය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා</u>**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා, මෙම අයවැය කෙටුම්පත ඕපනායක ලේකම් කොට්ඨාසය මූලික කරගත් අයවැයක් වන බවත් විපක්ෂය වනුවෙන් කිසිදු මුදලක් වෙන් කර නොමැති බවත් පැවසූ අතර වාහන, යන්ත්‍රසූත්‍ර, උපකරණ අළුත්වැඩියා හා නඩත්තු වියදම් වෙනුවෙන් විශාල මුදලක් වෙන් කර ඇති බැවින් එය අඩු විය යුතු බවත් සෞඛ්‍ය වෙනුවෙන් වැඩි මුදලක් වෙන්විය යුතු බවත් ක්‍රීඩා පිටි සඳහා මෙතරම් මුදලක් වෙන් නොවිය යුතු අතර ගොවිතැනට ප්‍රමුඛතාවය දිය යුතු බවද වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

එම පෙන්වා දුන් කරුණු අනුව විශාල සංශෝධන ප්‍රමාණයක් ඇති බැවින් එම සංශෝධනයන් සිදුකර මෙම අයවැය කෙටුම්පත නැවත සකස් කරන ලෙසත් පැවසූ අතර මෙම අයවැය කෙටුම්පතට විරුද්ධ බව ප්‍රකාශ කළේය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය</u>**

2023 අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය, අප සැවොම "හොඳම දේ දරුවන්ට " යන සංකල්පයට අනුගත වුවද මෙම අයවැය කෙටුම්පතට අනුව ක්‍රියාවෙන් එය සනාථ වී නොමැති බව පැවසූ අතර පෙර පාසැල් උපකරණ සඳහා වෙන් කර ඇත්තේ රු.100,000.00 ක් වැනි අඩු මුදලක් බැවින් මෙම කොට්ඨාස දෙකෙහිම පෙර පාසැල් ළමුන් පිරිසට මෙම මුදල ප්‍රමාණවත් නොවන බැවින් මෙය සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටියාය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා</u>**

2023 අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා, පාසැල් දරුවන්ට වැලිගෙපොල පුස්තකාලය දැනට පවතින ස්ථානයට ගමන්කිරීමේදී ඔවුන්ගේ කාලය නිකරුනේ වැය වන බැවින් දැනට පොළ පවත්වන ස්ථානයේ උඩුමහලට හෝ නගර මධ්‍යයට ගෙන එන ලෙස ඉල්ලා සිටි අතර වැලිගෙපොල මාළු ලැල්ල ගාස්තු පිළිබඳව හා එය ඒකාධිකාරියක් බවට පත් කරගෙන ඇති බවටද කරුණු සාකච්ඡා කළේය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා</u>**
ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා, මහජන නියෝජිතයින් ලෙස කටයුතු කිරිමේදී එකිනෙකාගේ දේශපාලන මතයන්, විවේචනයන් වැදගත් වන බවත් නමුත්, ජනතා මතය තුළ කටයුතු කිරීම අවශ්‍ය වන බවත් ප්‍රකාශ කළ අතර පසුගිය කාල වකවානුවේදී හුණුවල ග්‍රාමීය රෝහල ප්‍රාදේශීය රෝහලක් බවට පත් වීම සතුටුදායක කරුණක් වන බවත් බොජුන්හල, මළ අපවාහන පද්ධතිය ආදී සංවර්ධනයන් තුළින් වැලිගෙපොල ප්‍රාදේශීය සභාව පිළිගත හැකි සංවර්ධනයකට ලක් වූ බවත් ප්‍රකාශ කළේය.

තවද ගරු මන්ත්‍රීතුමා, සභා අරමුදලින් සියළුම මන්ත්‍රීවරුන්ට ලබාදෙන රු.2,000,000.00 ක ප්‍රතිපාදනය ලබාදීමට හැකිවේනම් තම ප්‍රදේශයන්ට සංවර්ධනය කටයුත්තක් සිදු කළ හැකි බවද ඉදිරියේදී මැතිවරණයකින් පත්ව එන සභාපතිතුමන් ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ට නිදහසේ තම සේවය කරගෙන යෑමට අවශ්‍ය පසුබිම සකසා තැබිය යුතු බවත් අවශ්‍ය බව වැඩිදුරටත් ප්‍රකාශ කරමින් 2023 වර්ෂයේ අයවැය කෙටුම්පතට සුභ පතමින් සිය කථාව අවසන් කරන ලදි.

අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා විසින් අදහස් දැක්වීමෙන් පසුව, එම අදහස් හා යෝජනාවන්ට අනුව ගරු සභාපතිතුමා විසින් පහත පරිදි වැය ශීර්ෂ සංශෝධනයට එකඟ වූ අතර, පහත පරිදි වැය ශීර්ෂ අතර ගැලපීමක් මඟින් ගරු මන්ත්‍රීතුමන්ලාගේ, මන්ත්‍රීතුමියන්ලාගේ ඉල්ලීම ඉටුකළ හැකි බවට යෝජනා කරන ලද අතර එකී යෝජනාව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි. තමරා යටිකිඳ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා විසින් ගෙනෙන ලද සංශෝධන ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලද අතර එකී සංශෝධනයන්ට යටත්ව 2023 වර්ෂය සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය කෙටුම්පත ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

| පහත වැය ශීර්ෂයෙන් | පහත වැය ශීර්ෂයට |
|---|---|
| 104(1) වාහන යන්ත්‍ර උපකරණ අළුත්වැඩියා හා නඩත්තු - රු.500,000/= | 609(1) පෙර පාසැල් උපකරණ ලබා ගැනීම සඳහා - රු.500,000/= (500,000+100,000= 600,000/=) |
| 105(9) පලාත් පාලන සතිය උත්සව කටයුතු - 60,000/=<br>103(2)B ඉන්ධන දීමනා - 30,000/= | 105(3)3 මන්ත්‍රී දුරකථන දීමනා - 90,000<br>(60,000+30,000=90,000)+710,000 = 800,000/= |
| 309(1) සභා කර්මාන්ත - 2,000,000/= | මාර්ග නඩත්තු සඳහා - 2,000,000/= |

II ඩී.එස්.අමරසිංහ, එන්.ගුණදාස, එච්.ඩී.එස්.සී.කුමාර, එල්.පී.එන්.ටී.ගුණවර්ධන, එස්.ඩබ්ලිව්.ටී. ඉන්ද්‍රවිජිත, බී.වී.ආර්.ප්‍රසාද් සහ කේ.බී.පී.පෙරේරා යන අයගේ සේවා ගිවිසුම් අළුත් කිරීම සහ ගලි ප්‍රතිකාරක මධ්‍යස්ථානයේ යන්ත්‍ර ක්‍රියා කිරීමට හා නඩත්තු කටයුතු සඳහා කේ.පී.මධුරංග දිල්ෂාන් මහතාගේ සේවය මාස තුනක් සඳහා මිලදී ගැනිම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේම කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා, මෙම නම් සඳහන් සේවා ගිවිසුම් අළුත් කරන පුද්ගලයන්ගේ තනතුරු පිළිබඳ විමසූ අතර එයට අදහස් දැක්වූ ගරු සභාපතිතුමා විසින්,

ඩී.එස්.අමරසිංහ, එන්.ගුණදාස, එච්.ඩී.එස්.සී.කුමාර - සෞඛ්‍ය කම්කරු
එල්.පී.එන්.ටී.ගුණවර්ධන - පුස්තකාල සහයක
එස්.ඩබ්ලිව්.ටී. ඉන්ද්‍රවිජිත - වැඩ ක්ෂේත්‍ර කම්කරු
කේ.බී.පී.පෙරේරා - නැණසල ක්‍රියාකරු
බී.වී.ආර්.ප්‍රසාද් - රියදුරු ලෙස වන බව ප්‍රකාශ කළේය. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

III LL-7615 හා ට්‍රැක්ටර් රථවල දැනට පවතින ටයරයන්ම නැවත පුරවා භාවිතයට ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, වර්තමානයේ ටයර්වල පවතින මිල අධික වීම හේතුවෙන් මෙම LL - 7615 දරණ වාහනයේ සහ ට්‍රැක්ටර් රථවල තිබෙන ටයරයන්ම නැවත පුරවා භාවිතයට ගැනීමට තීරණය කළ බව පැහැදිලි කළේය. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

IV හෙළ බොජුන්හල සඳහා, මූලික ගාස්තු අය නොකර ජල සම්බන්ධතාවය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි .

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා, ජල සම්බන්ධතාවය ලබා දීමේ මූලික ගාස්තුව සභාව සතු ආදායම් මාර්ගයක් වන බැවින් සහ මූලික පිරිවැයක් වැයවන හෙයින් හෙළ බොජුන්හලෙන් වුවද එම මූලික ගාස්තුව අයකරගන්නා ලෙස ප්‍රකාශ කළේය.

V නව චක්‍රලේඛයට අනුව, දැනට පවතින රු.1000.00 ක ගොඩනැගිලි කමිටු දීමනාව රු.2500.00 ක් දක්වා වැඩි කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

VI වැලිගෙපොල ප්‍රාදේශීය සභාව සතු නිල වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා ගිවිසුම් පත්‍රය අළුත් කිරීම සහ සේවා සැපයුම්කරු විසින් සේවය ලබාදීම වෙනුවෙන් එක් වර්ෂයක් සඳහා රු.12,000.00 ක මුදලක් ගෙවීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා, මෙම සේවය සැපයුම්කරු කවුරුන්ද යන්න විමසූ අතර ඊට අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, සංක සොෆ්ට් ක්‍රියේෂන් හි කළමණාකාර හල්ලව අප්පුහාමිලාගේ ජස්ටින් පේමදාස යන පුද්ගලයා මෙහි සේවා සැපයුම්කරු වන බව පැවසුවේය. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

VII ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහන සඳහා සහභාගි වන නිලධාරීන් වෙත අන්තර්ජාල පහසුකම් ලබාදීම, සංයුක්ත දීමනාව,ගමන් වියදම් හා ඉන්ධන දීමනාව ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහන කෙටි කාලයක් තුළ අවසන් කර යුතු බැවින් සභාවේ නිලධාරීන් බොහොමයක් මේ දිනවල එම කටයුත්තට යොමු කර ඇති බවත් මෙම කාර්යය සිදු කිරිමේදී සහභාගිවන නිලධාරීන් හට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවන හෙයින් එම නිලධාරීන්ට අවශ්‍ය කරන අන්තර්ජාල පහසුකම් ලබාදීම, සංයුක්ත දීමනාව, ගමන් වියදම් හා ඉන්ධන දීමනාව ගෙවීම යන පහසුකම් ලබාදීමට තීරණය කළ බවත් ප්‍රකාශ කළේය. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

VIII ගල්පාය කඩ කාමර, ඕපනායක පොළ ඉදිරිපිට කඩ කාමර, සභාව සතු ඉඩම්, සතිපොළ හා මාළු ලෑලි බදු දීම සඳහා වන ගිවිසුම් කෙටුම්පත් අනුමත කර ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා විසින් මෙම ගල්පාය කඩ කාමර, ඕපනායක පොළ ඉදිරිපිට කඩ කාමර, සභාව සතු ඉඩම්, සතිපොළ හා මාළු ලෑලි යන දේපල 2023 වර්ෂය වෙනුවෙන් බදුදීම සඳහා වන ගිවිසුම් කෙටුම්පත අනුමත කිරීම අවශ්‍ය බව පැහැදිලි කළේය.
ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.
.

IX රැස්වීම් ශාලාවේ වේදිකාව සඳහා තිරයක් සවි කිරීම සහ පුටු 500ක් ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා, මේ සඳහා ප්‍රතිපාදන ගරු ආණ්ඩුකාරතුමා හරහා වෙන්කර ගැනීමට හැකිවේද යන්න විමසූ අතර ඊට අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, මේ සඳහා ප්‍රතිපාදන සපයා ගැනීමට බලාපොරොත්තු වන්නේ සබරගමුව පළාත් සභාව මඟින් ප්‍රකාශ කරන ලද අතර එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

X රංවල පහල ගම්මැද්ද ක්‍රීඩා පිටියේ සහ කසල මධ්‍යස්ථානයේ රැඳවුම් මුදල් ප්‍රතිපූර්ණය කරන තෙක් සභා අරමුදලින් ගෙවීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

එහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා මෙම කර්මාන්ත දෙක මෙන්ම නිමකර ඇති අනෙකුත් කර්මාන්ත සඳහාද ප්‍රතිපාදන ලබා ගැනීම අවශ්‍ය වන බැවින් කර්මාන්ත සඳහා ප්‍රතිපාදන ලබා ගත් ක්‍රියා පටිපාටියටම මෙම මුදල්ද ලබාදෙන බව සුදුසු යැයි වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

XI සෝලා පැනල් පද්ධතිය සඳහා මිල තීරණය කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදි .(ටෙන්ඩර් පත් විවෘත කිරීම)

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, මෙම ටෙන්ඩර් පත් විවෘත කිරීම සඳහා මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීමට අවශ්‍ය බව ප්‍රකාශ කළේය.
ඒ සඳහා වූ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා විසින් සිදුකළ අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව පෙ.ව.11.00 ට ගරු සභාව කාරක සභාවක් බවට පත් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර් මණ්ඩලයේ කටයුතු ආරම්භ කරන ලදි.පසුව ටෙන්ඩර් මණ්ඩලයේ කටයුතු අවසන් වීමෙන් පසු නැවත කාරක සභාව

මහ සභාවක් බවට පත් කිරීම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර කුමාර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් සිදුවිය. අනතුරුව ටෙන්ඩර් මණ්ඩල තීරණය සහ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව පිළිබඳව සලකා බැලූ ගරු සභාව, ලැබී ඇති ලංසු සියල්ලෙන්, තාක්ෂණික පිරිවිතරයක් සපුරා ඇති සහ අවම මිල ගණන් ඉදිරිපත්කර ඇති "Sun Energy Solar Solution (pvt)Ltd" ආයතනයෙන් පළමු අදියර යටතේ පිරිවිතර අනුකූල ඉන්වේටර් පද්ධතියක් රු.818,170.00 ක මුදලකට සපයා සවිකර ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගත් තීරණය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා යෝජනා කරන ලදි. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොටුව මැතිතුමා එම යෝජනාව ස්ථිර කිරීමෙන් පසු එම එය ඒකමතිකව සභා සම්මත විය.

XII හෙළ බොජුන්හල ගිවිසුම අළුත් කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදි .

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා, හෙළ බොජුන්හල ගිවිසුම අළුත් කිරීම පිළිබඳ කරුණු විමසුවේය. ඊට අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, 2022/09/01 දින සිට 2022/12/31 දින දක්වා මාස 04ක කාලයකට පමණක් ගිවිසුම්ගතව ඇති බවත් 2022/12/31 දිනෙන් ගිවිසුම්ගත කාල සීමාව අවසන් බවත්, ඒ අනුව ගිවිසුම අළුත් කිරීම අවශ්‍ය බවත් පැහැදිලි කළේය.
ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

XIII කන්දෙ විහාර ජල මූලාශ්‍රයේ ගබඩා ජල ටැංකියක් ලබා ගැනීමේ කර්මාන්තයේ ඉතිරි කොටස් මෙම වර්ෂයේ ඉටුකිරීම සඳහා තීරණය ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා, මෙම ජල ටැංකිය අළුතෙන්ම ලබා ගැනීමක්ද යන්න කරුණු විමසුවේය. එයට අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, මෙහි භූගත ජල ටැංකිය සැකසීම ඉදිරියට කරගෙන යෑමට තිබෙන බවත් පළමු අදියරෙහි මොටර් සවි කිරීම පමණක් සිදු කර ඇති බවත් ප්‍රකාශ කළේය. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

XIV ශ්‍රී ලංකා අමරපුර නිකායේ වජිරවංශ පාර්ශවයේ සබරගමුව පළාතේ උප ප්‍රධාන සංඝනායක, ඕපනායක ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ විහාරාධිපති අතිපූජ්‍ය මොරහැල අරියඥාණ ස්වාමින්වහන්සේගේ ආදාහන පූජෝත්සවය වෙනුවෙන් තොරණ සැකසීම සඳහා වැය වූ මුදල සභා අරමුදලින් ලබා දීමට අනුමැතිය ලබා ගැනිම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 6. <u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>

### 6.1. මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තා

2022.09.30, 2022.10.13 සහ 2022.10.26 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාව මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 7. ආදායම් වියදම් වාර්තා

### 7.1. 2022 සැප්තැම්බර් මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 758,094.25 | වැටුප් හා දීමනා | 4,263,787.06 |
| කුලී | 483,067.86 | ගමන් වියදම් | 10,076.00 |
| බලපත්‍ර ගාස්තු | 35,000.00 | සැපයුම් හා උපකරණ | 1,326,543.00 |
| සේවා සඳහා ගාස්තු | 72,989.04 | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 219,704.03 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 3,705.48 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 403,518.72 |
| වෙනත් ආදායම් | 27,176.86 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 3,977,006.68 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 5,357,040.17 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 39,116.29 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 6,262,745.10 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 353,025.00 |
| පුනරාවර්ථන/ ප්‍රාග්ධනආදායම් එකතුව | 5,357,040.17 | ණය ආපසු ගෙවීම් | 694,849.01 |
| සේවක ණය | 153,014.67 | සේවක ණය | - |
| තැන්පත් | 175,067.84 | තැන්පත් | 850,140.06 |
| අත්තිකාරම් | 395,900.00 | ණයහිමි | 2,216,413.79 |
| ණය ගැති(කර්මාන්ත) | 2,196,713.79 | අත්තිකාරම් | 306,900.00 |
| සමුච්චිත අරමුදල | - | ජල ගබඩා | 416,338.85 |
| | | ගබඩා(ඖෂධ) | 127,730.00 |
| වෙනත් ලැබීම් එකතුව | 2,920,696.30 | සමුච්චිත අරමුදල | 5,750.00 |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 3,923,272.70 |
| මුළු එකතුව | 8,277,736.47 | මුළු ගෙවීම් | 10,539,042.80 |

### 7.2. 2022 සැප්තැම්බර් 30 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

ඇමුණුම 1 යා කර ඇත.

## 8. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

- පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව, ප්‍රකාශ කරන ලදී.

## 9. වෙනත් කරුණු

### 9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා, ප්‍රාදේශීය සභාවක් ලෙස වැලිගෙපොල ප්‍රාදේශීය සභාව, කීර්තිනාමයක් දිනාගෙන තිබීම පිළිබඳ සතුටු වන බවත්, නමුදු අවුරුදු තුනක් තිස්සේ පැවසුවද අලිමංකඩවල් වලට වීදි ලාම්පු සවිකර ගත නොහැකි වීම හේතුවෙන් වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ එම කොට්ඨාසයේ ජනතාව ගැන කණගාටු වන බවත් ප්‍රකාශ කළ අතර වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරුන් දෙදෙනෙකු වැලිගෙපොල ප්‍රදේශයෙන් පත් වී සිටියද මීගස්දෙනියෙන් පහළ හඳගිරිය ප්‍රදේශයට සංවර්ධනයක් නොවුන බව ප්‍රකාශ කළේය.

### 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

ඌරාවල විද්‍යාල පාර (හැවන්දෙනිය පාර) ජේ.සී.බී යන්ත්‍රය යොදවා හැකි ඉක්මනින් එළි පෙහෙළි කිරීමට අවශ්‍ය බවත් ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලෙසත් ප්‍රකාශ කළ ගරු මන්ත්‍රීතුමිය 2023 අයවැය කෙටුම්පත සඳහා අදාළ සංශෝධනයන්ට යටත්ව පක්ෂ වන බවත් වැලිගෙපොල කොට්ඨාසයේ අප ප්‍රදේශය පිළිබඳවත් අවධානය යොමුකරන ලෙසත් වීදි ලාම්පුවක් හෝ ලබාදීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටියාය.

### 9.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය

මෙහිදී අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය, 2023 අයවැය කෙටුම්පත සඳහා අදාළ සංශෝධනයන්ට යටත්ව පක්ෂ වන බවත්, ඉදිරියටත් වැලිගෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ජනතාවට සේවයන් ඉටුකරයි යැයි බලාපොරොත්තු වන අතර ඕපනායක විශාල සංවර්ධනයක් කිරීම පිළිබඳව සතුටු වන බවත් ප්‍රකාශ කළාය. ග්‍රාමීය ප්‍රදේශවල තිබෙන කැලි කසල ඉවත් කිරීමට කටයුතු කරන ලෙසත්, තැන්නහේන මාර්ගය දෙපස වැවී ඇති මානං එළිපෙහෙළි කර දෙන ලෙසත් ඉල්ලා සිටියාය.

### 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා, වන සතුන්ගෙන් (ඌරන්, රිලවුන් ආදී) සිදුවන හානි හේතුවෙන් වගාවන් විනාශ වීම නිසා ජනතාව බොහෝ සේ දුෂ්කරතාවයට පත් වී ඇති බව පැවසූ ගරු මන්ත්‍රීතුමා ඒ සඳහා පිළියමක් ලබා දෙන මෙන් ඉල්ලා සිටියේය.

## 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා හරහා ලියුම් යවනු ලැබුවද එයට ප්‍රතිචාරයන් නොලැබෙන බැවින් ඔවුන්ගේ ප්‍රතිචාර නොලැබෙනවානම් වෙනත් පියවරක් ගැනීමට කටයුතු කළ යුතු බවද පළමුවම ස්ථානය පරීක්ෂා කර ඒ අවශ්‍ය පියවර ගැනීම සුදුසු බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා, මේ සභා වාරය අවුරුද්දකින් දීර්ඝ වී ඇතත් සභිකයෙකු ලෙස සදාචාරාත්මක අයිතියක් ඇත්තේ අවුරුදු 4කට පමණක් බැවින් මහජනතාවගේ කැමැත්ත පරිදි සුදුසු පාර්ශවයක් තෝරා පත්කර ගැනීමේ අයිතිය ලබාදිය යුතු බවත් නමුදු ගරු ජනාධිපතිතුමා විසින් සීමා නිර්ණ කමිටුවක් පත්කර ගෙන ඡන්ද විමසීම කල් දැමීම පිළිබඳ තම විරුද්ධත්වය ප්‍රකාශ කරන අතර මහජනතාවට අවශ්‍ය නියෝජිතයන් පත්කර ගැනීමට ඡන්දයක් පැවැත්විය යුතු බවත් ප්‍රකාශ කළේය.

### සභා රැස්වීමේ නිමාව

ගරු සභාවේ මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් දැක්වීම පිළිබඳව ස්තුතිවන්ත වන අතර ප්‍රාදේශීය සභාවක් ලෙස කරගෙන යන සහ ඉදිරියට කරගෙන යැමට බලාපොරොත්තු වන කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම තුළින් ලබාගත් සියළු අදහස් හා යෝජනා ඉදිරි කටයුතු කිරීම සඳහා වැදගත් වන බවත් ප්‍රකාශ කළේය. තවද ප්‍රාදේශීය සභාවක් ලෙස යම් යම් කාර්යයන් ඉටු කිරීමේදී සීමාවන් තුළ ක්‍රියා කළ යුතුව තිබෙන බවත්, ගරු සභාවේ මන්ත්‍රීතුමන්ලාගේ,මන්ත්‍රීතුමියන්ලාගේ සහ සියළු නිලධාරීන්ගේ ගෞරවය ආරක්ෂා වන ලෙසත්, ප්‍රාදේශීය සභාවේ අනන්‍යතාවය ආරක්ෂා වන ලෙසත් කටයුතු කරන බව පැවසූ ගරු සභාපතිතුමා, අද දින අයවැය කෙටුම්පතට සම්බන්ධව සහ රැස්වීමේ කටයුතු සාර්ථකව කරගෙන යාමට සහය ලබාදුන් සියළු දෙනාට සිය ස්තූතිය පුදකරමින් දහවල් 12.45 ට පමණ සභා රැස්වීමේ කටයුතු නිමාවට පත් කළේය.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව